# ලැසී දෝණී



මයුරි සත්සරණී වාසනා

# කෘතියේ නම - තාරක

## කතෘ - මයුරි සත්සරණි වාසනා

## ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසල

## 5 A

**ISBN 978 - 624 – 211- 200 - 8**

කෘතිය පලකරන දිනය - 2026.05.10

# පිදුම

සිප් සතර කියාදුන් හංසිකා ගුරුතුමියටත්,

සියලුම ගුරු මෑණිවරුන්ටත්, ගුරු පියවරුන්ත්,

දෙමව්පියන්ටත් යෙහෙළියන්ටත්

ඉතා ආදරයෙන් මෙම ග්‍රන්ථය

පුද කරමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# පෙරවදන

මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර සහ අප පාසල් පුස්තකාල සභාව එක්ව සංවිධානය කළ මෙම ඊ-පොත් ව්‍යාපෘතිය වෙනුවෙන් මාගේ සුබාශිසංන පිරිනැමීමට මම ඉතා සතුටු වෙමි.

මෙම ව්‍යාපෘතිය අපගේ ශිෂ්‍යාවන්ගේ නිර්මාණශීලිත්වය, විචාරශීලී චින්තනය සහ උද්‍යෝගය මනාව පෙන්වා දෙයි. තරුණ සිසුන් කියවීම, ලිවීම සහ දැනුම බෙදාගැනීම සඳහා නවීන ඩිජිටල් තාක්ෂණය භාවිතා කිරීම දැකීම ඉතා සතුටට කරුණකි.

මෙම ව්‍යපෘතිය සාර්ථක කර ගැනීම සඳහා කැපවූ පුස්තකාලාධිපතිතුමියට, පුස්තකාල සභාවේ සාමාජිකයන්ට, ගුරුභවතුන්ට සහ ශිෂ්‍යාවන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි.

මෙම වැඩසටහන ඉගෙනීමට සහ නව දැනුම සෙවීමට තවත් උනන්දුවක් ඇති කරනු ඇතැයි මා විශ්වාස කරමි.

අපගේ ගුරුභවතුන්හට සහ ශිෂ්‍යාවන්ට අඛණ්ඩ මඟපෙන්ම ලබාදුන් ශ්‍රීමාන් සෙනෙවිරත්න මහලේකම් මහතාට විශේෂ ස්තූතිය පුද කරමි.

ඔබ සැමට සෑම සාර්ථකත්වයක්ම ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය ලලිත් නවරත්න
විදුහල්පති
ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසල

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.<br>
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.<br>
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

මම කෑමට දෙයක් සොයා ගෙන එන්නම්. ලැසී දෝණී ගුහාවට වෙලා ඉන්න. තාත්තා කිව්වා.



ඒත්, ලැසී දෝණී ,හොරෙන්ම පන්සල පැත්තට ගියා.



බුදු හාමුදුරුවන්ට පූජා කරන්නට මල් ටිකක් කඩන්න ඕනෑ ලැසී දෝණිට හිතුණා.



ඔන්න, හදිස්සියේම අහස කලුකර ගෙන ගොරවා ගෙන මහා වැස්සක් ඇද හැලෙන්න පටන් ගත්තා.



ලැසී දෝණිට හිතුණා තාත්තා කියන දේ අහලා ගුහාවට වෙලා ඉන්න තිබුණා කියලා.

මේ නම් ලෝක විනාශය ම තමා. ලැසී දෝණිට එහෙම හිතුනා. එයා ඉක්මනින් පන්සලට දිව්වා.



අනේ, මගේ තාත්තාට කිසිම අනතුරක් වෙන්න එපා. ලැසී එහෙම හිතුවේ හොඳටම බයවෙලා.



අයියෝ තාත්තා දන්නෑනේ මම පන්සලේ කියලා. ගුහාවට යන්නත් බැහැ හයියෙන් වහිනවානේ. අර ගෙදර සීයා ඉන්නවාද දන්නෑනේ.

අර එන්නේ සීයා නේද?...

සීයේ.....

ඇයි ලැසී දුවේ...

සීයා ළඟ කුඩයක් තියෙනවා ද?

තියෙනවා.. තියෙනවා.. ආ මෙන්න..

බොහෝම පින් සීයේ.. මම ආයෙත් කුඩේ ගෙනත් දෙන්නම්. මම ගිහින් එන්නම් සීයේ.

හරි, ලැසී දුවේ.

ලැසී දෝණී ගුහාවට ගියා. ලැසී දෝණීගේ පැතුම ඉටුවුනා. තාත්තා කිසිම අනතුරක් නොවී ලැසී දෝණී ළගට ආවා. ලැසී දෝණීටට හරිම සතුටුයි.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් .හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)